# 22 පාදනමස්කාරය

මීසම් සංසයේ වාර්ෂික චතාරික වන්දනා ගමන



එන්න, එක පවුලක දරුවන් සේ
මෙනෙහි කරමු කිතු සමිඳුන්ගේ
දුක්ප්‍රාප්තිය

| | |
|---|---|
| ස්ථානය: | හිනිදුම කල්වාරි පුදබිම |
| දිනය: | පෙබරවාරි 25 |
| පිටත් වීම: | පෙරවරු 4.00 |
| හිනිදුමෙන් පිටත් වීම: | පස්වරු 4.30 |
| ගමන් ගාස්තුව : | රු. 300/= (එක් අයකුට) |

ඔබේ අවධානයට :

ආසන සීමිත බැවින් පෙබරවාරි 11වන දිනට පෙර භාණ්ඩාගාරිකට මුදල් ගෙවා ආසන වෙන් කරවා ගැනීමට හා ගමනේ තොරතුරු පත්‍රිකාව ලබා ගැනීමට කාරුණික වන්න.

මෙම මීසම් සංසය මෙම වන්දනා ගමන යාමේ පරමාර්ථය පාදනමස්කාරය කිරීමට බව පැහැදිලි ය. පාදනමස්කාරය ක්‍රිස්තුන් වහන්සේගේ දුක්විඳීම හා උකුත්වීම සිහිපත් කරන්නා වූ භක්ති අභ්‍යාසයකි.

## පාදනමස්කාරයේ ඉතිහාසය

සභා සම්ප්‍රදායයේ සඳහන් වන පරිදි ක්‍රිස්තුන් වහන්සේගේ කුරුසියේ ගමන සටහන් වූ මාර්ගයෙහි මරිය තුමිය නිරතුරු ව ගමන් කර ඇත. කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යයා ආගම ඇදහීමේ නිදහස කිතුනුවන්ට දුන් පසු

ක්‍රිස්තුන් වහන්සේ කල්වාරිය කරා ගිය ගමනේ වැදගත් ස්ථාන ලකුණු කළ බව සඳහන් වේ. එම මාර්ගය ඔස්සේ කිතුනුවෝ පාද නමස්කාරය කළහ. ඒ සඳහා ශුද්ධ වූ දේශයට (පලස්තීනයට) යා යුතු විය. එහෙත් 5වන සියවසේ සිට ලෝකයේ විවිධ ස්ථානවල පාදනමස්කාරය කිරීම සඳහා ස්ථාන හා කල්වාරි සුදනම් කෙරිණි.

### පාදනමස්කාරයේ ස්ථාන

ක්‍රිස්තුන් වහන්සේ පිලාත් විසින් මරණයට තීන්දු කරනු ලැබූ අවස්ථාවේ සිට සොහොන්ගෙයි තැන්පත් කිරීම දක්වා වූ විශේෂ සිදුවීම් පාදනමස්කාර තුළ සිහිපත් කෙරෙයි. එය ස්ථාන 14කින් යුක්ත ය.

**පළමුවන ස්ථානය**



ජේසු ස්වාමිදරුවෝ මරණයට තීන්දුව ලබන සේක.

**දෙවන ස්ථානය**



දුෂ්ට ජුදයෝ ජේසුස් ස්වාමි දරුවන්ගේ ශ්‍රී කර පිට කුරුසිය තබති.

**තුන්වන ස්ථානය**



ජේසු ස්වාමිදරුවෝ පළමු වර බිම වැටෙන සේක.

**හතරවන ස්ථානය**



ජේසුස් ස්වාමිදරුවන්ට උන් වහන්සේගේ පිරිසිදු මැණියෝ සම්මුඛ වන සේක.

## පස්වන ස්ථානය



කුරුසිය ගෙන යන පිණිස සීමොන් සිරනේවුස් ජේසුස් ස්වාමි දරුවන්ට උදව් වෙයි.

## හයවන ස්ථානය



වෙරෝනිකා නම් භක්තිවන්ත ස්ත්‍රිය ජේසුස් ස්වාමි දරුවන්ගේ ශ්‍රී මුහුණ මණ්ඩලය පිස දමයි.

## හත්වන ස්ථානය



ජේසුස් ස්වාමි දරුවෝ දෙවන වර බිම වැටෙන සේක.

## අටවන ස්ථානය



ජේසු ස්වාමි දරුවෝ ජෙරුසලමේ ස්ත්‍රීන් සනසා වදාරන සේක.

## නමවන ස්ථානය



ජේසුස් ස්වාමි දරුවෝ තුන්වන වර බිම වැටෙන සේක.

## දහවන ස්ථානය



දුෂ්ට ජුදයෝ ජේසු ස්වාමි දරුවන්ගේ වස්ත්‍ර කඩා දමති.

**එකොළොස්වන ස්ථානය**



ජේසු ස්වාමි දරුවෝ කුරුසියේ ඇණ ගසනු ලබන සේක.

**දොළොස්වන ස්ථානය**



ජේසු ස්වාමි දරුවෝ කුරුසියෙහි උකුත් වන සේක.

**දහතුන්වන ස්ථානය**



ජේසු ස්වාමි දරුවෝ කුරුසියෙන් බානලදුව ව තමන් වහන්සේගේ පිරිසිදු මෑණියන්ගේ උකුළෙහි පුනවනු ලබන සේක.

**දාහතරවන ස්ථානය**



ජේසුස් ස්වාමි දරුවෝ ගල්ලෙනෙහි තැන්පත් කරනු ලබන සේක.

මෙම භක්ති අභ්‍යාසය සිදුකරන අනුපිළිවෙළක් පවතියි. එමෙන් ම එයට සුවිශේෂි වූ යාච්ඤා මෙන් ම ගීතිකා ද ඇත.

## පාදනමස්කාර සිදුකරන අනුපිළිවෙළ

- පාදනමස්කාරයේ ස්ථානය නම් කිරීම
- පදයඃ ක්‍රිස්තුනි ඔබට නමස්කාර කොට ස්තුති ප්‍රශංසා කරමු.
- උත්තරඃ මක්නිසාද යත් ඔබ වහන්සේගේ ශ්‍රී කුරුසයෙන් ඔබ වහන්සේ ලෝකය ගලවා ගත් සේක.
- මෙනෙහි කිරීම

- ස්වාමිවාක් ආරාධනාව, නමෝ මරිය යැදුම හා ත්‍රිත්වක ස්තෝත්‍ර යැදුම
- යාච්ඤාව
- පදය: ස්වාමීනී පාපි වූ අපට කරුණාකර වදළ මැනව.
- උත්තරය: අපට කරුණා කර වදළ මැනව.
- පදය: මළා වූ ක්‍රිස්තියානින්ගේ ආත්මවල් දේව දයාබරකමින්
  සමාදානයෙහි සැතපෙන ලද්දේ වා!
- උත්තර: ආමෙන්
- ගීතිකාව

  දේව කන්‍යා නිමල මවුනේ
  ඔබගේ කුමරා දරුව වණවල්
  මා හෘදයේ සන් කළ මැනව.

ක්‍රිස්තුන් වහන්සේගේ දුක්ප්‍රාප්තියේ ගමන පාදනමස්කාරය තුළින් අප විසින් සිහිපත් කරනු ලබයි. එබැවින් ගෞරවාන්විත ව හා අර්ථාන්විත ව මෙම භක්ති අභ්‍යාසය සිදු කරමින් අප ද එම වේදනාව දරා ගැනීමට පංගුකාර විය යුතු ය. එබැවින් චතාරික කාලයේ සැම සිකුරාදා දිනක ම හෝ හැකි සැම විට ම පෞද්ගලික ව හෝ සාමූහික ව මෙම භක්ති අභ්‍යාසයේ නිරත වීම කිතුනු අපගේ යුතුකමකි. එමෙන් ම ජීවිතයේ දුක් කම්කටොලු අභියෝග සතුටින් භාර ගෙන ජීවත් වෙමින් ද මර්දන ක්‍රියාවල නිරත වෙමින් ද මෙම කාලවකවානුව ගත කිරීම අපගේ යුතුකම වන්නේ ය.

**ක්‍රියාකාරකම**

1. පාදනමස්කාරයේ දී අප සිහිපත් කරන්නේ කුමක් ද?
2. මෙම භක්ති අභ්‍යාසය බිහි වීමට හේතු වූ ඓතිහාසික පසුබිම ලියා දක්වන්න.
3. එක් එක් ස්ථානයේ දී පාදනමස්කාරය කරන ආකාරය ලියා දක්වන්න.



**ජීවිතයට බිඳක්**

***චතාරික කාලයේ දී හැකි සැම විට ම තනි ව හෝ සාමූහික ව පාදනමස්කාරය කරමු.***